**ශීර්ෂය 159 - සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 159 - සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 742.62ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 388.33 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 354.29 ක් හෙවත් සියයට 47.71 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 118.29 | 115.00 | 3.29 | 2.78 |
| මූලධන | 624.33 | 273.33 | 351.00 | 56.22 |
| එකතුව | 742.62 | 388.33 | 354.29 | 47.71 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 15901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.00 | 2.98 | 0.30 | 1.66 | 8.00 | 6.62 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0457/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 1.78 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 03ක ශේෂ එකතුව රු.31,560 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු. |
| 6000/0000/00/0002/0151/000 | 4, 000 |
| 6000/0000/00/0013/0105/000 | 12,743 |
| 6000/0000/00/0016/0096/000 | 14,817 |
| එකතුව | 31,560 |

## 2.5 විගණන නිරීක්ෂණය

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2016 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු භාණ්ඩ අයිතම 28 ක අතිරික්තතා සහ අයිතම 01 ක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

වෙනත් අමාත්‍යාංශ 03 කට ලියාපදිංචි අයිතිය හිමි වාහන 06 ක් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය භාවිතයට ගෙන තිබුණි.

(ඇ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු බැරකම් රු.798,968 ක් විය.

**3.3 කාර්යසාධනය**

**-----------------**

2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණු ජලාශ්‍රිත ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම සහ ආසන 7000 කින් සමන්විත සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකිරීම ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික්ක 12 ක සංචාරක ආකාර්ශනය ඇති ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 43 ක් වෙනුවෙන් රු.මිලියන 500 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එසේ වුවද, ඉන් ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් වෙන් කර තිබූ රු.මිලියන 275.83 කින් රු.මිලියන 196.15 ක්, ව්‍යාපෘති සම්පූර්ණ නොකිරීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. එසේම එයින් රු. 10,894,639 ක් වැයකර තිබූ ව්‍යාපෘතීන් 04 කට අදාළ ලිපිගොනු නියැදියක් ලෙස ගෙන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(i) පෞද්ගලික ආයතනයකට මාසිකව ගෙවිය යුතු අන්තර්ජාල පහසුකම් ගාස්තු, ගෙවිය යුතු පාර්ශවය පිළිබඳව, ව්‍යාපෘතිය ආරම්භයේදී නිශ්චය කර නොතිබීම හේතුවෙන් රු.මිලියන 1.08 ක් වැයකර ඇල්ල නගරයේ ස්ථාන 04 ක 2016 දෙසැම්බර් 30 දින ස්ථාපිත කළ CCTV කැමරා පද්ධතිය 2017 ඔක්තෝබර් 10 දින වන විටත් නිශ්ක්‍රීයව පැවතුණි.

(ii) එම නිසා කැමරා පද්ධතිය සඳහා ලබා දී තිබූ වර්ෂ 02 ක වගකීම් කාලයෙන් මාස දහයක් අවසන් වී තිබූ අතර කැමරා පද්ධතියේ ඇතිවිය හැකිව තිබූ දෝෂයන් නිවැරදි කරගැනීමේ හැකියාව මග හැරීගොස් තිබුණි.

(ඇ) මැදිරිගිරිය වටදාගෙය අසල පොකුණ හා අවට සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 16.76 ක මුදලකට පෞද්ගලික ආයතනයක් උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍ය ලේකම් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි.එම ගිවිසුම 2016 දෙසැම්බර් 28 දින ඇති කරගෙන තිබුණු අතර මාස 2 කින් වැඩ නිම කළ යුතු බවට සඳහන් විය. ගිවිසුම්ගත දිනයේදීම උක්ත කොන්ත්‍රාත්කරු බිල්පත් පහක වටිනාකම වන රු.5,786,000 න් සියයට 80 ක මුදලක් වැඩබිමේ අමුද්‍රව්‍ය ලෙස අත්තිකාරම් මුදලක් ඉල්ලා තිබුණි. එම අත්තිකාරම් මුදල වූ රු.4,628,800 ට වැට් බදු වශයෙන් රු.694,320 ක් එකතුකර මුළු මුදලවන රු.5,323,120 න් රු.3,992,340 ක් (සියයට 75 ක්) කොන්ත්‍රාත්කරුට මුදා හැර තිබුණි.

ඉහත ගෙවීම සනාථ කිරීමට කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ පහත සඳහන් බිල්පත් පිළිගත නොහැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(i) ගිවිසුම්ගත දින හා ඊට පෙර දිනයන් සඳහන් බිල්පත් ඉදිරිපත් කිරීම

(ii) ප්‍රචාරණ කටයුතු කරන ආයතනයකින් සූර්ය කෝෂ ලාම්පු සඳහා බිල්පත් ලබා ගෙන තිබීම.

(iii) 2016 දෙසැම්බර් 28 දින පෞද්ගලික ආයතනයකින් බන්දිත ගල්කැට 100,000 කට ඉදිරිපත් කර තිබූ රු.3,500,000 ක් වූ සැපයුම් සාරාංශය, භාණ්ඩ සැපයීමේදී නිකුත් කළ බිල්පතක් ලෙස ඉදිරිපත් කිරීම හා එම ආයතනය එදිනට බන්දිත ගල්කැට කිසිවක් සපයා නොමැති වීම.

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2016 වර්ෂයේ හදිසි අනතුරකට ලක් වී තිබූ වාහනයක, රක්ෂණයෙන් ලද මුදලට වඩා අලුත්වැඩියා වියදම වැඩි වීම නිසා රු.437,277 ක පාඩුවක් සිදු වී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 12 | 02 |
| (ii) තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) ද්විතියික මට්මට | 30 | 24 | 06 |
| (iv) ප්‍රාථමික මට්ටම | 19 | 13 | 06 |
| (v) වෙනත් | 04 | 02 | 02 |
| එකතුව | 71 | 53 | 18 |